# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1402 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 30/08/2024<br>පැය 0600 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු සහ සැකකාරියක අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.08.29 වන දින දහවල් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස්පුර ප්‍රදේශයේදී, මට්ටක්කුලිය පොලිස් වසමේ සමිත්පුර ප්‍රදේශයේදී හා කොටහේන පොලිස් වසමේ මාදම්පිටිය ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 04 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 720 ක් සමග සැකකරුවෙකු, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 310 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 17,300/- ක් සමග සැකකරුවෙකු, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 540 ක් සමග සැකකරුවෙකු හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 360 ක් සමග සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29, 32 හා 43 යන වයස්වල පසුවන ග්‍රෑන්ඩ්පාස්, මට්ටක්කුලිය හා කොළඹ 13 ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 39 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.08.29 වන දින උදෑසන හා රාත්‍රී කාලවලදී සපුගස්කන්ද පොලිස් වසමේ කොට්ටුන්න ප්‍රදේශයේදී හා පිලියන්දල පොලිස් වසමේ මිරිස්වත්ත ප්‍රදේශයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීම් 02 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 400 ක් සමග සැකකරුවෙකු හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 ක් සමග සැකකාරියක්** අත්අඩංගුවට ගෙන සපුගස්කන්ද හා පිලියන්දල පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කොට්ටුන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 31 ක් වන පිලියන්දල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සපුගස්කන්ද හා පිලියන්දල පොලිස් ස්ථාන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.

2024.08.29 වන දින සවස් කාලයේ ජාඇල පොලිස් වසමේ තුඩැල්ල ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 250 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සංවිධානාත්මක අපරාධකරුවෙකු සමඟ සමීප සම්බන්ධතා පවත්වනු ලබන බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අවශ්‍ය කරන සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

යාපනය පොලිස් වසමේදී වෑන් රථයකට ගිනි තබා අනර්ථය සිදු කිරීමක් සහ නෙල්ලිඅඩි පොලිස් වසමේදී වෙළඳසැලකට ගිනි තබා අනර්ථය සිදුකිරීමක් සම්බන්ධව යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් විසින් විමර්ශන සිදුකර 2024.08.29 වන දින දහවල් කාලයේදී කෝපායි පොලිස් වසමේ උරුම්බිරායි ප්‍රදේශයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 850 ක් සහ මෙරට නිෂ්පාදිත අත් බෝම්බ 02 ක්** සන්තකයේ තබාගෙන සිටි සිද්ධියට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී තවත් **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 950 ක් සහ කඩු 04 ක්** සඟවා තිබියදී සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු යාපනය ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් විවෘත වරෙන්තු නිකුත් වී ඇති සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත. යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.08.29 වන දින අළුයම් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ යශෝරාපුර ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 40 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.**

2024.08.29 වන දින දහවල් කාලයේදී ගම්පහ පොලිස් වසමේ ගම්පහ දුම්රිය ස්ථානය අසලදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මංගලගම පොලිස් ස්ථානය.**

2024.08.29 වන දින දහවල් කාලයේ මංගලගම පොලිස් වසමේ මහියංගන යාය ප්‍රදේශයේදී මංගලගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 75 ක් වන මංගලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මංගලගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් ස්ථානය.**

2024.08.29 වන දින දහවල් කාලයේ නිකවැරටිය පොලිස් වසමේ පින්පොලේගම ප්‍රදේශයේදී නිකවැරටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වන නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිකවැරටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඊච්චලම්පත්තුව පොලිස් ස්ථානය.**

2024.08.29 වන දින රාත්‍රී කාලයේ ඊච්චලම්පත්තුව පොලිස් වසමේ ඉලංගතුරේ කලපු ප්‍රදේශයේදී ඊච්චලම්පත්තුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන ඊච්චලම්පත්තුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඊච්චලම්පත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගෝනගංආර පොලිස් ස්ථානය.**

2024.08.29 වන දින සවස් කාලයේ ගෝනගංආර පොලිස් වසමේ වැවේයාය ප්‍රදේශයේදී ගෝනගංආර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**11. හදිසි මරණයක් - කැකිරාව පොලිස් වසම.**

2024.08.29 වන දින සවස් කාලයේ කැකිරාව පොලිස් වසමේ ඔළුකරඳ ප්‍රදේශයේ වසා දමා තිබූ කඩ කාමරයක කොන්ක්‍රීට් වහලය මත පුද්ගලයෙකු මියගොස් ඇති බවට කැකිරාව පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ ඔළුකරඳ, කැකිරාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු දින කිහිපයකට පෙර මියගොස් ඇති බවට පොලිසිය කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇත. කැකිරාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**12. හදිසි මරණයක් - සමන්තුරය පොලිස් වසම.**

2024.08.29 වන දින රාත්‍රී කාලයේ සමන්තුරය පොලිස් වසමේ අලිවන්නියාර් මාර්ගයේ පිහිටි ලී මෝලකට මොණරාගල ප්‍රදේශයේ සිට ලොරියකින් රැගෙන එන ලද දැව කඳන් බාමින් සිටි එම ලොරි රථයේ රිය සහායක දැව කඳකට යට වී මියගොස් ඇති බවට සමන්තුරය පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ හිඳිකිවුල, මොණරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කල්මුණේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සමන්තුරය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**13. වන අලි පහරදීමකින් පුද්ගලයෙකු මියයාම - හම්බන්තොට පොලිස් වසම.**

2024.08.29 වන දින දහවල් කාලයේ හම්බන්තොට පොලිස් වසමේ දිමුතුගම ප්‍රදේශයේ වන අලි පහරදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට හම්බන්තොට පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ කොග්ගල, හබරාදුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ඉහත ප්‍රදේශයේ තාවකාලිකව පදිංචිව සිට ගව පාලනය සිදු කරමින් සිටියදී මෙම පහරකෑමට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණය සිදුකර හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හම්බන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - යක්කලමුල්ල පොලිස් වසම.**

2024.08.29 වන දින උදෑසන කාලයේ යක්කලමුල්ල පොලිස් වසමේ යක්කලමුල්ල අකුරැස්ස මාර්ගයේ කරාගොඩ ප්‍රදේශයේදී යක්කලමුල්ල දෙස සිට අකුරැස්ස දෙසට ධාවනය වූ ලංගම බස් රථයක් ඉදිරියෙන් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු සහ පිටුපස ගමන්කළ දැරියක් බරපතල තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී දැරිය මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 17 ක් වූ කරාගොඩ, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. යක්කලමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - අලව්ව පොලිස් වසම.

2024.08.29 වන දින රාත්‍රී කාලයේ අලව්ව පොලිස් වසමේ අලව්ව නාරම්මල මාර්ගයේ රථනාලාංකාර විද්‍යාලය අසලදී නාරම්මල දෙස සිට අලව්ව දෙසට ධාවනය වූ ලොරි රථයක මාර්ගය හරහා ගමන්කළ පදික කාන්තාවක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව බරපතල තුවාල ලබා අලව්ව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 74 ක් වූ නාරම්මල පාර, අලව්ව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය අලව්ව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අලව්ව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - හෙට්ටිපොල පොලිස් වසම.

2024.08.29 වන දින රාත්‍රී කාලයේ හෙට්ටිපොල පොලිස් වසමේ හලාවත කුරුණෑගල මාර්ගයේ කැලියාව ප්‍රදේශයේදී කුරුණෑගල දෙස සිට හලාවත දෙසට ධාවනය වූ යතුරුපැදියක් තවත් යතුරුපැදියට ඉස්සර කිරීමට යාමේදී යතුරුපැදිය පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයේ පෙරළීමෙන් ඉදිරියෙන් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා හෙට්ටිපොල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ හල්මිල්ලවැව, හෙට්ටිපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හෙට්ටිපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**